# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1997 අංක 18 දරන
## මානව සම්පත් සංවර්ධනය කිරීමේ
## ශ්‍රී ලංකා ජාතික සභාව පනත

---

[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


1997 අගෝස්තු මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 12.50 යි. තැපැල් ගාස්තුව : රු. 4.60 යි.

# 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනත

[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින.]

එල්. ඩී. — ඕ 19/96

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පිහිටුවීම සඳහා ද මානව සම්පත් සංවර්ධනය කිරීමට අදාළ ප්‍රතිපත්ති උපනයනය කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහභාගිවීමේ කාර්ය සඳහා සහ ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

## I වන කොටස

## මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

2. (1) මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පිහිටුවීම.

(2) සභාව, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර, එකී නාමයෙන් සභාව විසින් ද සභාවට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

3. (1) සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය. සභාවේ සංයුතිය.

(අ) අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඇ) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඈ) විද්‍යා හා තාක්ෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඉ) කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

2—ඩී042360—5,900 (96/11)

(ඊ) රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා :

(උ) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා :

(ඌ) තරුණ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා :

(එ) කාර්මික සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා :

(ඒ) කෘෂිකාර්මික විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා :

(ඔ) සැළසුම් ක්‍රියාත්මක කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා; සහ

(ඕ) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා :

(ක) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ සභාපතිවරයා :

(ග) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ච) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ පත් කරන ලද තෘතීයික අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයා :

(ජ) අධ්‍යාපන, සෞඛ්‍ය, රැකීරක්ෂා, සංවර්ධන හෝ පර්යේෂණ යන ක්ෂේත්‍රවල පළපුරුද්ද හෝ සුදුසුකම් හෝ දක්ෂතා ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙක් : එයින් යටත් පිරිසෙයින් දෙදෙනකු පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත තැනැත්තන් විය යුතුය. (මේ ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු මෙහි මින් මතු "පත් කළ සාමාජිකයා" යනුවෙන් හඳුන්වනු ලැබේ.)

(2) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව,පළාත් සභා මන්ත්‍රීවරයකුව හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකුව සිටින හෝ එවැනි මන්ත්‍රීවරයකු නැතහොත් සභිකයකු වශයෙන් පත් වන තැනැත්තෙක් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස සිටීමට නුසුදුස්සෙක් වන්නේ ය.

සභාවේ පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයා සතු බලය.

**4.** සභාවේ පත් කළ සාමාජිකයකු කිසිදු හේතුවක් නොදක්වා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ සාමාජිකයා එසේ ධුරයෙන් ඉවත් කිරීම ගැන කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

පත් කළ සාමාජිකයන් ඉල්ලා අස්වීම.

**5.** (1) පත් කළ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් කවර වේලාවක වුව ද තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම පිළිගනු ලැබූ බවට අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයාට ලිඛිතව දැනුම් දෙන තුරු ඒ ඉල්ලා අස්වීම බලාත්මක නොවන්නේ ය.

(2) සභාවේ පත් කළ සාමාජිකයකු මිය ගිය හොත්, ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්, ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු, 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලබන සාමාජිකයා කලින් මිය ගිය හොත්, ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, තම පූර්වගාමියාගේ නොගෙවී ශේෂ වී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සභාවේ සාමාජිකයන් තාවකාලිකව පත් කිරීම.

**6.** සභාවේ පත් කළ සාමාජිකයකු, රෝගීභාවය, දුබලතාව හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැර ගොස් සිටීම හෝ හේතු කොට ගෙන තම ධුරයේ කටයුතු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී එකී නොහැකිවීම පිළිබඳව අමාත්‍යවරයාට ලිඛිතව දැනුම් දීම ඒ සාමාජිකයාගේ යුතුකම වන්නේ ය. එවිට අමාත්‍යවරයා විසින්, 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

නිල බලයෙන් පත් වන සාමාජිකයන්ගේ ධුර කාලය ආදිය.

**7.** (1) 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ), (ඒ), (ඔ), (ඕ) (ක) (ග) (ච) සහ (ජ) ඡේදවල සඳහන් සභාවේ සාමාජිකයකු එසේ සභාවේ සාමාජිකයකු වී ඇත්තේ කවර නිලයක් දැරීම හේතු කොට ගෙන ද ඔහු ඒ නිලය දරන තාක් කල් සභාවේ සාමාජිකත්වය දැරිය යුතු ය.

(2) 4 හා 5 වගන්තිවල විධිවිධානවලට යටත්ව පත් කළ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු හතරක් වන්නේ ය.

(3) ධුර කාලය ඉකුත්වීම හේතු කොට ගෙන තම ධුරය හිස් කරන සභාවේ පත් කළ සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.

**8.** සභාවේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් තීරණය කළ යුතු ය.

සභාවේ සභාපතිවරයා.

9. (1) අමාත්‍යවරයා විසින් සභාවේ පත් කළ සාමාජිකයන් අතුරින් (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාපතිවරයකු පත් කළ යුතු ය.

(2) අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයා විසින් සභාපති ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබූ විට එය බලාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් හේතු නොදක්වාම සභාපතිවරයා සභාපති ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ, ඉවත් කිරීම ගැන කිසිදු අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුත්තේ ය.

(4) මේ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධූර කාලය, සභාවේ ඔහු සාමාජිකත්වය දරන කාලය වන්නේ ය.

(5) රෝගාතුරවීම හෝ වෙනත් දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ගොස් සිටීම නිසා හෝ තම ධූරයේ කාර්ය ඉටු කිරීමට සභාපතිවරයාට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, (1) වන උප වගන්තියේ විධිවිධාන යථා පරිදි සැලකිල්ලට ගනිමින්, සභාපතිවරයා වෙනුවට වැඩ බැලීමට සභාවේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

සභාවේ රැස්වීම්.

10. (1) සභාවේ සෑම රැස්වීමකම මුලසුන සභාපතිවරයා විසින් දැරිය යුතු ය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරින් කෙනකු ඒ රැස්වීමේ සභාපති වශයෙන් තෝරා පත් කරගත යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් සභාව සඳහා ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු ය. සභාවේ සියලු වාර්තා සහ සියලු කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඒ ලේකම්වරයා වගකිව යුතු ය;

(3) සභාවේ යම් රැස්වීමක ගණපූරණය සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් වේ.

(4) සභාවේ යම් රැස්වීමක දී සාකච්ඡා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රශ්ණයක්, ඒ රැස්වීමට පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්දය සමසම ව ලැබුණු අවස්ථාවක දී සභාපතිවරයා හෝ ඒ රැස්වීමේ මූලසුන දරන සාමාජිකයා විසින්, තම ඡන්දයට අමතරව, තීරණ ඡන්දයක් පාවිච්චි කළ යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් දැක්වුන, විධිවිධානවලට යටත්ව, සභාවේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සභාව විසින් විධිමත් කර ගනු ලැබිය හැකි ය.

(6) සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන්ම පමණක් හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හෝ තෝරා පත් කිරීමෙහි ලා යම් දෝෂයක් හේතුවෙන්ම පමණක් හෝ සභාවේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය.

11. (1) සභාවේ මුද්‍රාව සභාව භාරයෙහි තිබිය යුතු ය. සභාවේ මුද්‍රාව.

(2) සභාවේ මුද්‍රාව සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) සභාවේ මුද්‍රාව සභාවේ සාමාජිකයන් දෙදෙනකු සහ ලේකම්වරයා ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සියලු දෙනාම තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට අත්සන් තබනු ලැබිය යුතු ය.

12. (1) සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සහ සභාව විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන විශේෂ හෝ සාමාන්‍ය විධාන අමාත්‍යවරයා විසින් සභාව වෙත කලින් කල දෙනු ලැබිය හැකි ය. විධාන.

(2) අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන පරිදි සභාවේ කර්තව්‍යවලට අදාළ තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල සභාවට විධාන කළ හැකි ය.

13. මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ස්වකීය ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සකස් කිරීමේ දී පළාත් සභා සහ පළාත් පාලන ආයතන විසින් සභාව විමසා කටයුතු කරනු ලැබිය හැකි ය. සංවර්ධන ප්‍රතිපත්ති.

## II වන කොටස

## සභාවේ කාර්ය, කර්තව්‍ය සහ බලතල

14. (I) සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි වන්නේ ය :- සභාවේ කාර්ය සහ කර්තව්‍ය.

(i) පහත දැක්වෙන කාරණාවලට එනම්,-

(අ) රැකීරක්ෂා, පුහුණුව සහ අධ්‍යාපනය ;

(ආ) විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම ;

(ඇ) ජීවන තත්ත්වය නංවාලීම ;

(ඈ) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම ; සහ

(ඉ) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් ඛණ්ඩ පරිමේය කිරීම සහ සමෝධානය කිරීම ඇතුළුව, ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශ වලින් අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ii) ජාතික ප්‍රතිපත්තියට අනුකූල වූ මානව සම්පත් සංවර්ධනය කිරීමේ සැලසුම් හා වැඩ සටහන්, ආණ්ඩුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යවරයාට නිර්දේශ කිරීම ;

(iii) ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මකව පවත්නා සැලසුම් සහ වැඩ සටහන් කලින් කල සමාලෝචනය කිරීම හා පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වන විටක, ඒ ප්‍රතිපත්තියට, සැලසුම්වලට සහ වැඩ සටහන්වලට කළයුතු වෙනස් කිරීම් අමාත්‍යවරයාට නිර්දේශ කිරීම ;

(iv) ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීම ;

(v) මේ පනතේ උපලේඛනයේ සඳහන් කවර හෝ විෂයයන් හා සම්බන්ධ යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම; එසේ වුවද එම ව්‍යාපෘතිය වෙනත් යම් අමාත්‍යවරයකුට පවරා තිබෙන විෂයයක් හා සම්බන්ධ වන අවස්ථාවක, එය ක්‍රියාත්මක කිරීම, ඒ වෙනත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව විය යුතු ය; සහ

(vi) ජාතික අරමුණුවලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍ය යයි හෝ හිතකර යයි හෝ ආනුෂංගික යයි සභාව අදහස් කරන වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම.

(2) මේ වගන්තිය යටතේ සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ දී මේ පනතේ උපලේඛනයෙහි සඳහන් විෂය කරුණු ගැන සභාව විසින් විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු අතර, ඒ විෂය කරුණු පවරා දී ඇති අමාත්‍යාංශයේ අදාළ දෙපාර්තමේන්තුව හෝ ආයතනය විමසා සභාව විසින් කටයුතු කළ යුතු ය.

අමාත්‍යවරයන්ගේ බලතල කෙරෙහි බලපෑමක් නොසිදු වියයුතු බව.

15. මානව සම්පත් සංවර්ධනයට සම්බන්ධ යම් විෂය කරුණක් හෝ කර්තව්‍යයක් භාරව සිටින අමාත්‍යවරයකු විසින් හෝ රජයේ නිලධරයකු විසින් හෝ, 14 වන වගන්තියේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි බලතල කිසිවක් කෙරෙහි මේ

පනතේ අඩංගු කිසිවක් බල නොපාන අතර එසේ බලපාන්නේ යයි හෝ ඒ බලතලවලට අගතියක් වන්නේ යයි හෝ නොසැලකිය යුතු ය.

16. (1) සභාවේ කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලු ක්‍රියා සිදුකිරීමේ බලය සභාවට ඇත්තේ ය. සභාවේ බලතල.

(2) (1) වන උපවගන්තියෙන් සභාව වෙත පැවරෙන බලතලවල ව්‍යාප්තියට හානියකින් තොරව, පහත දැක්වෙන කටයුතු කිරීමේ බලය සභාවට ඇත්තේ ය:-

(අ) සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සමීක්ෂණ, විමර්ශන, අධ්‍යයන සහ පර්යේෂණ කිරීමට ;

(ආ) මානව සම්පත් සංවර්ධනයට අදාළ කාරණා සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ, වෘත්තිකයන්ගේ හෝ මහජනයාගේ මතය දැන ගැනීම සඳහා ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව කරුණු විමසීමට ;

(ඇ) සභාව විසින් ඉටු කරනු ලබන කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි ජාත්‍යන්තර නියෝජ්‍යායතන සහ වෙනත් සංවිධාන සමඟ සම්බන්ධතා ඇති කරගෙන පවත්වා ගෙන යාමට ;

(ඈ) මේ පනත යටතේ සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලු කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට එළඹීමට සහ ඒවා ඉටු කිරීමට ;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල පිහිටි ආයතන හෝ පුද්ගලයන් මගින් මානව සම්පත් සංවර්ධන පර්යේෂණ පැවැත්වීම සඳහා කටයුතුවල යෙදීමට ;

(ඊ) මානව සම්පත් සංවර්ධනය සහ ඊට සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වා ගෙන යාමට ;

(උ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ තැන්පතු ගිණුම් විවෘත කොට පවත්වාගෙන යාමට ;

(ඌ) චංචල සහ නිශ්චල යන දෙවර්ගයේම ආධාර සහ පරිත්‍යාග පිළිගැනීමට සහ භාර ගැනීමට ;

(එ) මානව සම්පත් සංවර්ධනයේ විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් සංවර්ධනය කිරීම අරමුණු කොට ගෙන සභාවේ නිලධරයන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට ;

(ඒ) සභාවේ කර්තව්‍ය සාර්ථක ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කමිටු, විශේෂඥ කණ්ඩායම් සහ උපදේශක මණ්ඩල පත් කිරීමට ;

(ඔ) අමාත්‍යාංශ වලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වලින් රාජ්‍ය සංස්ථා වලින්, ව්‍යවස්ථාපිත මණ්ඩල වලින්, පළාත් සභා වලින්, පළාත් පාලන ආයතන වලින් සහ පෞද්ගලික අංශයේ ආයතන වලින් ලබා ගන්නා සංඛ්‍යා ලේඛන ඇතුළුව, සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන තොරතුරු ඉල්ලා සිටීමට සහ ඒවා ලබා ගැනීමට ; සහ

(ඕ) සභාවේ කර්තව්‍ය, බලතල සහ කාර්ය ඉටු කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සිදු කිරීම සඳහා අවශ්‍ය යයි, හිතකර යයි හෝ ආනුෂංගික යයි සභාවේ මතය අනුව සභාව විසින් සලකනු ලබන සියලු පියවර ගැනීමට.

## III වන කොටස

### සභාවේ කාර්ය මණ්ඩලය

ප්‍රධාන විධායක නිලධරයා.

17. (1) සභාපතිවරයා සභාවේ ප්‍රධාන විධායක නිලධරයා වන්නේ ය.

(2) සභාවේ රැස්වීම්වල න්‍යාය පත්‍රය පිළියෙල කිරීම සහ මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි සභාපතිවරයා විසින් සලකනු ලබන ප්‍රතිපත්ති හා පියවර සභාව විසින් සලකා බලනු පිණිස සභාව වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා වගකිව යුතු ය.

(3) මේ පනතින් සභාව වෙත පවරා ඇති බලතල අතුරින් කිසිවක් (මේ උපවගන්තියෙන් සභාව වෙත පවරා ඇති බලතල නොවන) සභාව විසින්, යෝජනා සම්මුතියක් මගින්, සභාපතිවරයා වෙත පැවරිය හැකි ය. තමා වෙත පවරන ලද එවැනි බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී සභාපතිවරයා සභාවේ සාමාන්‍ය විධානවලට යටත් විය යුතු ය.

(4) සභාපතිවරයා සභාවේ ප්‍රධාන විධායක නිලධරයා වුව ද, ඔහු සභාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නොසැලකිය යුතු ය.

සභාවේ ලේකම්වරයා.

18. (1) සභාවට ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු අතර (මේ පනතේ මින් මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඔහු මානව සම්පත් සංවර්ධන ජාතික සභාවේ ලේකම්වරයා යනුවෙන් හඳුන්වනු ලැබේ. ඔහු සභාවේ ලේකම් කාර්යාලය භාරව ද සිටිය යුතු ය.

(2) ලේකම්වරයා විසින් සභාවේ රැස්වීම් පිළිබඳ වාර්තා තැබිය යුතු අතර, ඒ රැස්වීම්වල දී කථා කිරීමේ හිමිකම ඔහුට ඇති නමුත් ඒ රැස්වීම්වල දී ඡන්දය දීමේ හිමිකම ඔහුට නොමැත්තේ ය.

(3) සභාව විසින් ලේකම්වරයා වෙත පවරනු ලබන බලතල ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී, අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන විධාන නිකුත් කිරීමේ බලය ඔහුට ඇත්තේ ය.

(5) ලේකම්වරයා විසින් කරන ලද යම් විධානයක් සංශෝධනය කිරීමේ, ප්‍රතිශෝධනය කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ බලය සභාව සතු වේ.

සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම.

19. (1) සභාව විසින්, මේ පනත් විධිවිධානවලට යටත්ව –

(අ) සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය හැකි ය. තවද, ඒ නිලධරයන් හෝ සේවකයන් විෂයෙහි විනය පාලනය පවත්වා ගෙන යාම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම කරනු ලැබිය හැකි ය ;

(ආ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පඩිනඩි හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කරනු ලැබිය හැකි ය ;

(ඇ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අරමුදලක් හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ඇති කොට එය විධිමත් කොට එවැනි අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන්මේ පනත යටතේ රීති සෑදිය හැකි ය.

රජයේ සේවයේ නිලධරයන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

20. (1) සභාවේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, සභාව විසින් , එවැනිම කැමැත්ත ඇතිව, නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස

## මුදල්

සභාවේ අරමුදල

21. (1) සභාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) පහත දැක්වෙන මුදල් සභාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය :-

(අ) සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා සිදු කිරීමේ දී සභාවට ලැබෙන සියලු මුදල් ;

(ඇ) ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ආධාර මුදල් වශයෙන් සභාවට ලැබෙන සියලු මුදල්.

**22.** මේ පනත යටතේ සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සභාව විසින් දරන ලද යම් වියදමක් ගෙවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සහ සභාවේ අරමුදලින් ගෙවීමට මේ පනතින් හෝ මේ පනත යටතේ නියම කොට ඇති හෝ බලය දී ඇති සියලු මුදල් ප්‍රමාණ සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. අරමුදලින් කරනු ලබන ගෙවීම්.

**23.** සභාවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය ම වන්නේ ය. සභාවේ මුදල් වර්ෂය.

**24.** රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය. සභාවේ ගිණුම් විගණනය කිරීම.

## V වන කොටස

## පොදු විධිවිධාන

**25.** තම කාර්යවලට අවතීර්ණ වීමට පෙර සභාවේ සෑම සාමාජිකයකුට සහ සියලුම නිලධරයන් හා සේවකයන් විසින්, සභාවේ කටයුතු වලට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් දැඩි ලෙස රහස්‍යභාවය රකින බවට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශනයක් අත්සන් කලයුතු අතර, පහත දැක්වෙන අවස්ථාවල දී හැර, එනම්– රහස්‍යභාවය ප්‍රකාශ කිරීම.

(අ) අධිකරණයක් විසින් නියම කරනු ලැබූ විට, හෝ

(ආ) මේ පනතේ විධිවිධාන කිසිවක් ඉටු කිරීම සඳහා, හෝ

හැර තම කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී තමාට දැනගන්නට ලැබෙන කිසිදු කරුණක් එළිදරව් නොකරන බවට ඒ ප්‍රකාශනයෙන් ප්‍රතිඥා දිය යුතු ය.

**26.** (1) මේ පනත යටතේ සභාවේ බලතල සහ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට සභාවට හැකි වනු පිණිස, සභාව විසින් හෝ තත් කාර්යය සඳහා සභාව විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින්, යම් තැනැත්තකු වෙත ලිඛිත දැන්වීමක් යවමින්, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කොට ඇති වාර වාර්තා හෝ තොරතුරු ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය තුළ දී සභාව වෙත හෝ සභාව විසින් බලය පවරනු ලැබූ තැනැත්තා වෙත සපයන ලෙස හෝ සභාව වාර වාර්තා සහ තොරතුරු.

විසින්, නැතහොත් තත් කාර්යය සඳහා සභාව විසින් බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් පවත්වනු ලබන යම් විභාගයකට පැමිණ සිටින ලෙසත් සභාව විසින් හෝ යට කී බලය පවරනු ලැබූ තැනැත්තා විසින් නියම කරනු ලබන තොරතුරු සපයන ලෙසත් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් වාර වාර්තාවක් හෝ තොරතුරු සපයන ලෙස නැතහොත් යම් විභාගයකට පැමිණ යම් තොරතුරක් සපයන ලෙස මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් යම් තැනැත්තකුට නියම කරනු ලැබූ විට, ඒ වාර වාර්තා හෝ තොරතුරු සැපයීම මේ පනතේ විධිවිධාන යටතේ තහනම් කර ඇති අවස්ථාවක දී හැර, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය තුළ දී ඒ දැන්වීමෙහි අඩංගු නියමයන් ඒ තැනැත්තා විසින් පිළිපැදිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ දැන්වීමකට අනුකූලතාව දක්වමින් (1) වන උපවගන්තිය යටතේ සපයනු ලැබූ වාර වාර්තාවක අඩංගු යම් තොරතුරක්, ඒ වාර්තාව හෝ තොරතුරු සපයන තැනැත්තාගේ කැමැත්ත ඇතිව මිස නැතහොත් සභාවේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී මිස, සභාව විසින් ප්‍රසිද්ධ කිරීම හෝ වෙනත් යම් තැනැත්තකු වෙත සැපයීම නොකළ යුතු ය.

27. (1) (අ) 26 වගන්තිය යටතේ යවනු ලබන දැන්වීමක අඩංගු නියමයන් පිළිපැදීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන ;

(ආ) 26 වන වගන්තිය යටතේ යවනු ලැබූ දැන්වීමක අඩංගු නියමයන් පිළිපැදීමේ දී සපයන යම් වාර වාර්තාවක හෝ තොරතුරක යම් අසත්‍ය හෝ සාවද්‍ය ප්‍රකාශයක් දැන දැන ම කරන ;

(ඇ) සභාව විසින් පවත්වනු ලබන නැතහොත් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් පවත්වනු ලබන යම් විභාගයක දී සපයනු ලබන යම් තොරතුරක අසත්‍ය හෝ සාවද්‍ය ප්‍රකාශයක් දැන දැන ම කරන ;

(ඈ) සභාවේ සාමාජිකයකු හෝ නිලධරයකු හෝ සේවකයකු හෝ වශයෙන් සිටිමින් මේ පනත යටතේ තම බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක

කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී නැතහොත් ඊට සම්බන්ධව හෝ තමා විසින් ලබා ගනු ලබන නැතහොත් තමාට දැනගැනීමට ලැබෙන යම් තොරතුරක් එය එළිදරව් කිරීමට මේ පනතින් ඔහුට බලය දී ඇති යම් කාර්යයක් සඳහා හැර, කවර වුවද කාර්යයක් සඳහා කවර වුවද තැනැත්තකුට එළිදරව් කරන

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නෙක් වන්නේ ය.

(2) මේ පනත යටතේ වරදකට වරදකරු වී මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලබන, සෑම තැනැත්තෙක්ම රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට යටත් වන්නේ ය.

(3) මේ පනත යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක දී, -

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙක්ම හෝ නිලධාරයෙක්ම, හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය වයාපාරික ආයතනයක් නම් ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවෙක්ම

ඒ වරදට වරදකරුවෙක් වන්නේ ය :

එසේ වුවද, ඒ වරද සිදුකරන ලද්දේ තම අනුදැනීම ඇතිව නොවන බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා දැඩි උනන්දුවෙන් තමා ක්‍රියා කළ බව එවැනි සංස්ථාවක අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ එවැනි ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවකු හෝ විසින් ඔප්පු කරනු ලැබුව හොත් ඔහු ඒ වරදට වරදකරු නොවන බව සැලකිය යුතු ය.

මේ පනත යටතේ හෝ සභාවේ විධානය පිට හෝ කරනු ලැබූ ක්‍රියා සඳහා ආරක්ෂාව සැලසීම.

**28.** සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින්, මේ පනත යටතේ හෝ සභාවේ විධානය පිට, සද්භාවයෙන් කරනු ලැබූ හෝ සද්භාවයෙන් කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

නියෝග.

**29.** (1) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගවල නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට ඒ නියෝග ක්‍රියාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු පහසු තාක් ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් ඒ නියෝගය යටතේ කලින් කරනු ලැබූ යම් දෙයකට ඉන් අගතියක් නොවන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

සභාවේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**30.** සභාවේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව සභාව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු බව.

**31.** සභාව, අල්ලස් පනතේ අර්ථානුකූලව, උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**32.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**33.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් නියම කර ඇත්තම් මිස මේ පනතෙහි –

"ආයතනය" යන්නෙන්, කර්මාන්තයක්, වාණිජ කටයුත්තක්, වෙළෙඳ ව්‍යාපාරයක් හෝ වෘත්තියක් පවත්වා ගෙන යන යම් ස්ථානයක් අදහස් වේ ;

"මානව සම්පත් සංවර්ධනය" යන්නට, පහත දැක්වෙන ආර්ථික හා සමාජ සංවර්ධන කාරණා ඇතුළත් වේ :-

(අ) මිනිස් බලය උපයෝගී කර ගැනීම, රැකිරක්ෂා ජනනය කිරීම, නිපුණතා සංවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනය දීම හා පුහුණු කිරීම ;

(ආ) ආර්ථික භාණ්ඩ සහ සේවා සම්පාදනය කිරීම සඳහා විද්‍යාව හා තාක්ෂණය යෙදවීම ; සහ

(ඇ) පෝෂණය, නිවාස, සෞඛ්‍යාරක්ෂාව සහ අනෙකුත් මූලික අවශ්‍යතා, පාරිසරික සංරක්ෂණය සහ සමාජ ආරක්ෂණය මගින් ජීවන තත්ත්වය නංවාලීම.

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු සහ ඉටු කරනු ලැබිය යුතු බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප හෝ සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට යම් නීතියක් මගින් හෝ යම් නීතියක් යටතේ ඇතිකොට පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන්, මානව සම්පත් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

"ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව" යන්නෙන්, 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව අදහස් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, ආධාර මුදල් වශයෙන් හෝ ණය වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ සම්පූර්ණයෙන් ම නැතහොත් අර්ධ වශයෙන් ආණ්ඩුව විසින් සපයනු ලැබූ අරමුදල් හෝ ප්‍රාග්ධනය යොදා යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

## 1 වන උපලේඛනය

(14 වන වගන්තිය)

(1) පරිපාලනය

1.1 පරිණත දැනීමකින් යුතුව තීරණ ගැනීමට ජනතාවට හැකි වන පරිදි, තොරතුරු ලබා ගැනීමට සහ දැනුවත්වීමට ජනතාවට ඇති ප්‍රවේශය පුළුල් කර ගැනීමෙන් ජනතාවගේ වගකීමකින් යුත් සහභාගිත්වය.

1.2 ඵලදායි ලෙස ආර්ථික වශයෙන් සහ සමාජීය වශයෙන් සහභාගිවීමට ජනතාවට හැකි වන සේ අවස්ථා ලබාදීම.

1.3 රාජ්‍ය සහ පෞද්ගලික අංශවල මානව සම්පත් උපයෝගිතාව වැඩි දියුණු කිරීම.

1.4 රටේ ආර්ථික, සමාජීය සහ දේශපාලන ජීවිතයට කාන්තාවන්ගේ සහභාගිත්වය.

1.5 මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා මධ්‍යම ආණ්ඩුවේ සහ පළාත් සභා මට්ටමින් ආණ්ඩුවේ පහසුකම් උපරිම ලෙස යොදා ගැනීම.

(2) අධ්‍යාපනය

2.1 කෘත්‍යමය සාක්ෂරතාව සහ විශ්ව ව්‍යාප්ත මූලික අධ්‍යාපනය.

2.2 ද්විතීය සහ තෘතීය අධ්‍යාපන ක්‍රම දියුණු කිරීම.

2.3 රටේ සංවර්ධනමය අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසු පශ්චාත් උපාධි අධ්‍යාපන සහ පර්යේෂණ ආයතන පිහිටුවීම.

2.4 දුරස්ථ අධ්‍යාපන පද්ධතියක් සංවර්ධනය කිරීම.

2.5 රටේ සංවර්ධනමය අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසු වෘත්තීය සහ දක්ෂතා දියුණු කිරීමේ පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කර පවත්වා ගෙනයාම සහ ඒවා අතර සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම.

(3) සේවා නියුක්ති

3.1 සේවා නියුක්ති අවශ්‍යතාවලට සරිලන සේ ශ්‍රම බලකාය නංවාලීම සහ කාර්මීකරණ ප්‍රවණතාවලට ගැලපෙන සේ ශ්‍රමික දක්ෂතා ඉහළ නැංවීම.

3.2 විරැකියා හා ඌන සේවානියුක්ති ප්‍රවණතා සහ ඒවාට හේතු සොයා දැනගැනීම.

3.3 කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීම, නුපුහුණු සහ අර්ධ පුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනීමට විධිපූර්වක නොවූ අංශයේ ඇති ධාරිතාව වැඩි දියුණු කිරීම.

3.4 විදේශීය රැකියා අවස්ථා නංවාලීම සහ මේ අවස්ථාවලින් සම්පූර්ණ ප්‍රයෝජනය ගත හැකි වන පරිදි පුහුණු කිරීමේ වැඩ සටහන් ඇති කිරීමේ හැකියාව ගවේෂණය කිරීම.

(4) විද්‍යාව හා තාක්ෂණය

4.1 තරුණ තරුණියන් අතර විද්‍යාත්මක සහ තාක්ෂණික දක්ෂතා වැඩි දියුණු කිරීම.

4.2 තරුණ තරුණියන්ට පරිගණක තාක්ෂණය හඳුන්වා දීම.

4.3 මෘදුකාංග වෙළඳපල අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට හැකි වන සේ පරිගණක දක්ෂතා වැඩි දියුණු කිරීම ප්‍රවර්ධනය කිරීම.

4.4 විද්‍යුත් සංදේශනවලට සහ තොරතුරු පද්ධතිවලට ප්‍රවිෂ්ටය පුළුල් කිරීම.

4.5 බුද්ධි ගලනය පිළිබඳ ප්‍රශ්න සහ විද්‍යාත්මක සහ තාක්ෂණික සේවා පිරිස් තම කර්තව්‍ය ඉටු කරන්නේ කවර තත්ත්වයක් යටතේ ද ඒ තත්ත්වයන් වැඩි දියුණු කිරීමට සහාය දීම.

(5) හිමිකම්

5.1 දුගීභාවය සාර්ථක ලෙස තුරන් කිරීමේ ක්‍රමෝපාය සකස් කිරීම.

5.2 අඩු වාසිදායක කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂණ පියවර සැලසුම් කිරීම.

5.3 අඩු වාසිදයක සියලුම සමාජ කණ්ඩායම්වලට තම හිමිකම්වලට ප්‍රවිෂ්ටය ලබා ගැනීම ගැන සහතික වීම.

5.4 ස්ත්‍රී පුරුෂ වශයෙන් සලකා විශේෂත්වයකට භාජනය කිරීම අවම ප්‍රමාණයට අඩු කිරීම සහ එමගින්, මානව සම්පත්වල ශක්‍යතාව අපතේ යාම අඩු කිරීම.

(6) ජනගහනය

6.1 සමාජය කොටස්වලට බිඳීයාමට තුඩු දෙන ප්‍රජා විද්‍යාත්මක වෙනස්වීම් සහ ඊට අදළ කරුණු.

6.2 නාගරික සහ ග්‍රාමීය සංක්‍රමණය සහ, අධි ජනගහනය හා දුගී භාවය වැනි ඉන් ඇතිවන ප්‍රතිඵල.

6.3 ව්‍යාපිත පවුල් බිඳීයෑම සහ මව හෝ පියා පමණක් ඇති පවුල් සංඛ්‍යාව ඉහළ නැගීම කෙරෙහි ඇතිවන බලපෑම්.

6.4 ළමයින් ගණිකා වෘත්තියෙහි යෙදවීම ඇතුළුව ලිංගිකත්වය වාණිජ වශයෙන් උපයෝජනය කර ගැනීමට අදළ ප්‍රශ්න.

6.5 මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම සහ ලිංගික අනුසාරයෙන් බෝවන රෝග පැතිරයාම පිළිබඳ ගැටළු.

6.6 තරුණ තරුණියන් අතර වගකීමෙන් යුත් මාතෘ පිතෘ භාවය.